කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
பெண்கள் மற்றும் ஊடகக் கூட்டமைப்பு
Women and Media Collective
Established 1984

# මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ යෝජනා - 2021 ජූලි 15

මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීතිරීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව වෙත ඉදිරිපත් කෙරෙන යෝජනා මාලාව:

**කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය; ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානය , කුරුණෑගල දිස්ත්‍රික්කය; කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය ,බදුල්ල දිස්ත්‍රික්කය; කාන්තා සහයෝගීතා පෙරමුණ, මහනුවර දිස්ත්‍රික්කය; ගැමි කාන්තා පෙරමුණ, ගාල්ල දිස්ත්‍රික්කය සහ මානව සම්පත් සංවර්ධනය සඳහා වන විළුදු මධ්‍යස්ථානය, උතුරු, නැගෙනහිර සහ වයඹ පළාත් යන සංවිධාන මගින් ඉදිරිපත් කෙරේ.**

මෙම ඉදිරිපත් කිරීම පදනම් වන්නේ වසර 2021 ජුනි මස 12 සහ 16 යන දෙදින තුළ කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය විසින් සංවිධානය කරන ලදුව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් දිවයින පුරා විසිර සිටින කාන්තා දේශපාලඥයින්, ක්‍රියාකාරින් සහ නීතිවේදීන් සමග පවත්වන ලද උපදේශක සාකච්ඡා මතය. එමෙන්ම වසර 2004 මැයි මස මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව වෙත සහ වසර 2016 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ නියෝජන කමිටුව වෙත ද අප විසින් ඉදිරිපත් කරන ලද අදහස් තුළ අන්තර්ගත නිර්දේශය ද මීට ඇතුළත්ය.

මෙම මූලික කෙටුම්පත් සම්පාදන මට්ටමේදී මහජන අදහස් කැඳවීම වෙනුවෙන් ස්තුතිය පුද කරන අතර ම, උපදේශක සාකච්ඡාවෙහි තවත් වාරයක් වන අවස්ථාව පුළුල් කරමින්, තම තීරණ සහ පූර්ව අවසාන නිර්දේශ මහජනතාව සමග බෙදාහදා ගන්නා ලෙස කාරක සභාව වෙතින් අපි ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටීමට කැමැත්තෙමු. එමෙන්ම අපගේ නිර්දේශ පිළිබඳ වඩාත් පූර්ණ වශයෙන් සාකච්ඡා කිරීම උදෙසා මහජන අදහස් විමසීමේ කමිටුව හමුවීමට ද අප කැමැත්තෙන් පසුවන බව ද දන්වා සිටින්නෙමු.

මෙම නිර්දේශ මාලාව කොටස් දෙකකින් යුක්තය ; පළමු කොටස කාන්තා නියෝජනය වැඩි කිරීම ඇතුළුව ඡන්ද විමසීම් ක්‍රියාවලිය ප්‍රතිසංස්කරණය කිරීම හා සම්බන්ධ අතර, දෙවැන්න පොදුවේ මැතිවරණ ප්‍රතිසංස්කරණ හා ශ්‍රී ලංකාවේ දේශපාලනික සංස්කෘතිය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම සඳහා වන නිර්දේශවලට අදාළව වේ. ආරම්භයේ සිටම, සමස්ත සමානුපාතිකත්වය; ස්ත්‍රී පුරුෂ සමජභාවී සමතුලිත බව, වගවීම සහතික කිරීම සහ සදාචාරාත්මක සහ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සංස්කෘතියක පැවැත්ම සහතික කිරීම පිළිබඳව වන ප්‍රධාන මූලධර්ම හතර ප්‍රකාරව මැතිවරණ ප්‍රතිසංස්කරණයේ කේන්ද්‍රීය කරුණු සලකා බලන ලෙසට කාරක සභාව වෙත පැවසීම අපගේ අපේක්ෂාවයි.

**අ. නියෝජන මැතිවරණ ක්‍රමය**

ජනරජයක පුරවැසියන් වශයෙන්, ශ්‍රී ලංකාවේ ජනතාව ස්වෛරී වන අතර ඔවුන් විසින් සියලු දේශපාලන බලතල පාලනය කෙරේ. එබැවින් , ජනතා අපේක්ෂා පිළිබිඹු වන මැතිවරණ ක්‍රමයක් රටට අවශ්‍යය. සමානුපාතික නියෝජන ක්‍රමයේදී, දිනාගන්නා ආසන සංඛ්‍යාව සහ ප්‍රකාශිත ඡන්දවල අනුපාතය අතර දැක්වෙන ඍජු සම්බන්ධතාව මගින් ජනතා කැමැත්ත පිළිබඳ පිළිබිඹුවක් දැක්වේ. මැතිවරණ ක්‍රමයක් සඳහා සමානුපාතිකත්වය පිළිබඳ

මූලධර්මය වැදගත් වන අතර ඒ මක් නිසාද යත් එමගින් නියෝජනයේ බහුවිධතාවක් ඇති කරන බැවින් සහ කිසිදු තැනැත්තකු අත් නොහැරෙන බව සහතික කෙරෙන හෙයිනි. එවැනි නියෝජනයේ බහුවිධතාවක් නොමැතිව නිර්මාණය වන රජයක ප්‍රතිපත්ති සහ ජනතා අපේක්ෂා අතර නොගැලපීම් මතු විය හැකිය.

කේවල ක්‍රමය මගින් ඡන්දදායකයන්ට තමන් අභිමත අපේක්ෂකයා තෝරා ගැනීමට ඉඩකඩ සැලසේ. යම් මැතිවරණ කොට්ඨාශයක වැඩිම ඡන්ද සංඛ්‍යාවක් හිමිවන අපේක්ෂකයා විසින් ඔහුගේ/ඇයගේ ආසනය ජය ගනියි. මෙහිදී, තමන් සඳහා ඡන්දය ලබා දුන් ජනතාව වෙනුවෙන් ඔවුන් වගකිවයුතු වන බැවින් අපේක්ෂකයන් සහ ඔවුන්ගේ කොට්ඨාශ අතර වගවීම තහවුරු වේ. එසේවුවද මෙම ක්‍රමය මගින් අනිවාර්යයෙන්ම සමාන නියෝජනයක් සහිත ස්ථාවර රජයක් ඇති නොකරයි. ශ්‍රී ලංකාවේ අත්දැක ඇති පරිදි, 30% ක ඡන්ද ප්‍රමාණයක් ලබාගන්නා පක්ෂයකට පාර්ලිමේන්තුවේ ආසනවලින් 50%ක ප්‍රමාණයක් ලබා ගැනීමේ හැකියාව ලැබේ (වසර 1970 සහ 1977 ශ්‍රී ලංකා මැතිවරණ ප්‍රතිඵල ). ශ්‍රී ලංකාව සමානුපාතික ක්‍රමයකට අවතීර්ණ වීමට මෙකී කරුණද හේතුපාදක වූ අතර මෙම සමානුපාතිකත්ව මූලධර්මය වත්මන් මැතිවරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ ආරක්ෂා කරනු ලැබිය යුතු ය. එලෙසම සීමා නිර්ණ මායිම් ද නැවත සලකුණු කල යුතුව ඇත.

**ශ්‍රී ලංකාවේ විවිධත්වය පිළිබිඹු කිරීම**

ශ්‍රී ලංකාවේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය තුළින් එහි ජනවාර්ගික සහ ආගමික සුළුතරයන්ගේ සහ ප්‍රජාවන්ගේ විවිධත්වය පිළිබිඹු කළ යුතු ය. මෙම කණ්ඩායම්වලට පාර්ලිමේන්තුවේ දී, පළාත් සභාවල දී සහ පළාත් පාලන ආයතන මට්ටමේදී පවත්නා තමන්ගේ නියෝජනය පිලිබඳ විශ්වාසය පලකළ හැකි විය යුතු ය. භෞමික වශයෙන් ස්ථානගත වූ සංඛ්‍යාත්මකව අඩු නියෝජනයක් සහිත ජනවාර්ගික ප්‍රජාවන් කේවල ක්‍රමයට වැඩි නැඹුරුවක් දැක්විය විය හැකි වුවද, භෞමික වශයෙන් විසිර සිටින සංඛ්‍යාත්මක ව අඩු නියෝජනයක් සහිත ප්‍රජාවන් හා අනෙකුත් කණ්ඩායම් හට ලැයිස්තුවක් මත සහ ඡන්දවල සමානුපාතිකත්වය මත පදනම් වූ සමානුපාතික නියෝජන ක්‍රමයක් අවශ්‍ය විය හැකිය. සමානුපාතික නියෝජන ක්‍රමය වඩාත් සමානුපාතිකමය වන බැවින් එමගින් කුඩා දේශපාලන පක්ෂවලටද සමාන ලෙස තම නියෝජනය දැක්වීමට ඉඩ සලසන අතර ම නොයෙක් දේශපාලනික මතවාද සඳහාද අවකාශ සලසයි.

බහුත්ව නියෝජනයක් තහවුරු කෙරෙන සමානුපාතිකත්ව මූලධර්මය පවත්වාගෙන යාම සම්බන්ධයෙන්, මෙසේ යෝජනා විය:

I. ඡන්දදායකයන් හට තනි අපේක්ෂකයන් තෝරා ගැනීමට අවස්ථාව ලබා දෙමින්, සමානුපාතිකමය වූ සමස්ත ප්‍රතිඵලයක් ලබා දෙන මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් වන මිශ්‍ර සහික සමානුපාතික ක්‍රමය මගින් අපගේ අවශ්‍යතා වඩා හොඳින් ඉටු කරනු ඇතැයි යන්න අප සතුව පවත්නා විශ්වාසයයි.[1] මෙහි ඉතා වාසිදායකම පිළිබිඹුව වන්නේ කේවල ක්‍රමයේ ආසන වලට ලැයිස්තුවේ ආසන අනුපාතය 50:50 වශයෙන් බෙදී යාමයි. 60:40 අනුපාතයට වෙන්වීම ද සලකා බලනු ලැබුවද, 70:30 අනුපාතය මගින් සමානුපාතිකත්වයේ කාර්යය ඉටු නොවේ.
II. සංඛ්‍යාත්මකව අඩු නියෝජනයක් සහිත දේශපාලන පක්ෂවල සහ වඩා කුඩා ඡන්ද කොට්ඨාශ සහිත දේශපාලන පක්ෂවල සාධාරණ නියෝජනය සහතික කිරීම සඳහා අනුදත් කඩඉම් ඡන්ද ප්‍රතිශතය (threshold) එක් දිස්ත්‍රික්කයකට 2.5%ක ප්‍රතිශතයක් ලෙස පවත්වාගෙන යනු ලැබිය යුතු ය.
III. සමානුපාතික සහ/හෝ ජාතික ලැයිස්තුව මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව එකී ලැයිස්තු තුළට කිසිවක් එකතු කිරීමට ඒවායෙහි කිසිදු වෙනස්කමක් සිදු

---

[1] WMC recommendations to the Committee for drafting a new Constitution
https://womenandmedia.org/submission-of-proposals-for-constitutional-reform-december-2020/

කිරීමට නොහැකි විය යුතු ය.[2]

IV. බෝනස් ආසන සහ මනාප ඡන්ද ක්‍රමය වැනි ක්‍රම, එකම දේශපාලන පක්ෂයේ සාමාජිකයන් අතර පවා අහිතකර තරගකාරිත්වයක් නිර්මාණය වීමට හේතුවී ඇති බැවින් ඒවා ඉවත් කිරීමට කටයුතු කළ යුතු ය.

V. මිශ්‍ර සමානුපාතික නියෝජනය තුළ, ඡන්දදායකයන් හට කේවල කොට්ඨාශ හා සමානුපාතික යන දෙයාකාරයෙන්ම වෙන් වෙන්ව ඡන්ද පත්‍රිකා දෙකක් භාවිත කරමින් තම ඡන්දය භාවිත කිරීමට අවස්ථාව සැළසිය යුතුය. මෙමඟින් ඡන්දදායකයන් හට තනි අපේක්ෂකයෙක් හා දේශපාලන පක්ෂයක් යන තේරීම් දෙකම වෙන් වෙන්ව සිදුකිරීමේ වැඩි අවස්ථාවක් හිමිවේ.

ස්වාධීන අපේක්ෂකයන් සහ ජාතික ලැයිස්තුව

VI. කේවල මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ සඳහා ස්වාධීන කණ්ඩායම් සෑදීමෙන් තොරව ස්වාධීන අපේක්ෂකයන් ලෙස තරග කිරීමට එක් එක් තනි පුද්ගලයන්ට හට පහසුකම් සැලැස්විය යුතු ය.

VII. ජාතික ලැයිස්තුව මගින්, එහි අපේක්ෂිත කාර්යය වන වෘත්තියෙන් දේශපාලඥයන් නොවන වෙසෙස් ප්‍රවීනත්වයක් දක්වන්නන් ව්‍යවස්ථාදායකය වෙත ගෙන එන බවට සහතික වීම වැදගත් ය.

VIII. ජාතික ලැයිස්තුව මගින් ප්‍රත්‍යාවර්ත ලෙස එනම් එකක් හැර එකක් වශයෙන් සහ ප්‍රමුඛතා අනුපිළිවෙලට පුරුෂයන් සහ කාන්තාවන් නම් කර තිබිය යුතු අතර නාම යෝජනා කිරීමේ අවස්ථාවේ දී මෙම අනුපිළිවෙල ස්ථිර විය යුතු ය. ජාතික ලැයිස්තුවෙන්/සමානුපාතික නියෝජන ලැයිස්තුවෙන් පත් කිරීම් සිදු කිරීමේ දී, එම පත් කිරීම් ස්ථිර ප්‍රමුඛතාවක් සහිතව මෙකී අනුපිළිවෙලට අනුව සිදු කරනු ලැබිය යුතු අතර ලැයිස්තුවෙන් පිටත කිසිදු පත් කිරීමක් සලකා බලනු නොලැබිය යුතු ය.

**ආ. කාන්තා නියෝජනය සහ ස්ත්‍රී පුරුෂ සමතුලිතතාව**

අතීතයේ සිටම දේශපාලනය තුළ කාන්තා නියෝජනය අතිශය පහළ මට්ටමක පවතී. දේශපාලන පක්ෂ, නියෝජන දේශපාලනයේ රැකවලුන් බවට පත්ව ඇති අතර කාන්තාවන්ට මැතිවරණවලට ඉදිරිපත් වීම සඳහා නාමයෝජනා මත යැපෙමින් සිටීමට සිදුව ඇත. ප්‍රධාන ධාරාවේ දේශපාලන පක්ෂ, කලාතුරකින් 6%කට වැඩි නාමයෝජනා ප්‍රමාණයක් කාන්තාවන්ට ලබා දී ඇති අතර, එහෙයින්, මෙම ඓතිහාසික අසමතුලිතතාව වෙනස් කිරීමට ධනාත්මක පියවර ගැනීමෙන් කාන්තාවන් වළක්වා ඇත.[3] පළාත් පාලන ආයතනවල කොට්ඨාශවලට තරග කිරීමට නාමයෝජනාවලින් අවම වශයෙන් 10%ක් කාන්තාවන් සඳහා වෙන් කර දෙමින් ගන්නා ලද පළමු පියවර වෙත අපගේ ප්‍රසාදය පළ කරන අතර කාන්තාවන්ට අතිරේක අපේක්ෂක ලැයිස්තුවෙන් 50%ක් ලබාගත හැකි විය. මෙම අනිවාර්ය විධිවිධාන මගින් සියලුම පළාත් පාලන ආයතනවලින් 25%ක් කාන්තාවන් බව සහතික කිරීමට කොමිෂන් සභාවට නියම විය. මැතිවරණ කොට්ඨාශ 341න් 15ක් හැර අන් සියල්ලක්ම මෙය සාක්ෂාත් කරගත්හ. කාන්තාවන්ට සෘජුව ආසනයක් ජයග්‍රහණය කළ නොහැකි ය යන මතය බිඳ හෙලමින් සමස්තයක් ලෙස කොට්ඨාශවලින් 10% ක් කාන්තාවන් ජයග්‍රහණය කළහ. එබැවින්, මෙම ධනාත්මක සහ ස්ථිර විධිවිධාන ශක්තිමත් කරන ලෙසට අප මහජන නියෝජන කමිටුව වෙත කියා සිටින අතර එවිට පළාත් පාලන ආයතන තුළ කාන්තාවන්ගේ නියෝජනය 25%ට වඩා වැඩි කළ හැකි අතර එවැනි සමාන දෘඪ පියවර පාර්ලිමේන්තු සහ පළාත් සභා මට්ටමේදී හඳුන්වා දෙනු ලැබේ. මෙය

---

[2] Ibid

[3] Kodikara, C., The struggle for Equal Political representation of women in Sri Lanka, A Stocktaking Report for the Ministry of Child Development and Women's Empowerment and the UNDP, 2010 https://scholar.google.com/citations?view_op=view_citation&hl=en&user=gSjh2AkAAAAJ&citation_for_view=gSjh2AkAAAAJ:Se3iqnhoufwC

ශ්‍රී ලංකාවේ දේශපාලනය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීමේ වැදගත් පියවරක් මෙන්ම එය නියෝජනයේ සමානත්වය වැඩි කරගැනීම කෙරෙහි වන තීරණාත්මක පියවරක් බවත් අප තරයේ විශ්වාස කරන්නෙමු.

ඒ අනුව අප මෙසේ යෝජනා කරන්නෙමු:

I. මිශ්‍ර සහික නියෝජන ක්‍රමයකදී දී, කේවල ක්‍රමයේ ආසනවලට තරග කිරීමට නාම යෝජනා කර ඇති මුළු අපේක්ෂක සංඛ්‍යාවෙන් එක් අර්ධයක් කාන්තාවන් සතු විය යුතුය. පළාත් පාලන ආයතනවලට තරග කිරීම සඳහා නෛතික වශයෙන් පවරන ලද කෝටාව අනුව, කොට්ඨාශවලට තරග කිරීම සඳහා වන නාමයෝජනාවලින් 10%ක අවමයක් දැනට කාන්තාවන්ගෙන් කැඳවන අතර එය සමස්ත ආසන ගණනින් 60%ක් වේ. මෙම අවමය ආරම්භක අවස්ථාවේ 20% ප්‍රතිශතයක සිට 50% දක්වා ක්‍රමිකව වැඩි කරන ලෙස අප ඉල්ලා සිටිමු.
II. යම් තෝරා පත්කරගත් ආයතනයක් සඳහා වන මැතිවරණ ක්‍රියාවලියකදී කාන්තාවන්ට සහ පුරුෂයන් හට සාධාරණ අවස්ථාවන් ලැබිය යුතු බවට මැතිවරණ නීති මගින් විධිවිධාන සැලැස්විය යුතු ය. එබැවින්, ස්ත්‍රී සහ පුරුෂ යන දෙපිරිසේම සහභාගිත්වය සමානුපාතික නියෝජනයේ සහ ජාතික ලැයිස්තුවේ මුළු අපේක්ෂක සංඛ්‍යාවෙන් සියයට හතළිහට (40%) නොඅඩු සහ සියයට හැටට (60%) නොවැඩි විය යුතු ආකාරයෙන් සමතුලිතබවකින් පැවතිය යුතු බව අප ප්‍රකාශ කොට සිටින්නෙමු.
III. ප්‍රමුඛතා අනුපිළිවෙලින් අපේක්ෂකයන් ස්ත්‍රී සහ පුරුෂ වශයෙන් මාරුවෙන් මාරුවට ලැයිස්තු ගත කර සමානුපාතික නියෝජනය සහ ජාතික ලැයිස්තු ස්ථිර ලෙසින්ම අවුරා තැබිය යුතු ය. මෙම අවශ්‍යතාව මගින් පත්කිරීමේ අනුපිළිවෙල ලැයිස්තුගත කිරීමේ දී විනිවිදභාවයෙන් යුක්තව එය සිදු කිරීමට දේශපාලන පක්ෂවලට සිදුවන අතර එහිදී පත්කිරීම් තහවුරු කිරීම සඳහා කාන්තාවන්ට ද පුරුෂයන්ට මෙන් සම අවස්ථා ලබා දිය යුතු වේ. තවද එයින් ඡන්දදායකයා වෙත ශ්‍රේණිගත කරන ලද ලැයිස්තුවක් ලැබෙන අතර පත් කිරීමේ ක්‍රියාවලිය විවෘත, පැහැදිලි සහ ප්‍රජාතන්ත්‍රවාදීත්වයක් උසුලයි.
IV. නාමයෝජනා සිදු කරන අවස්ථාවේ දී ස්ථිර කරන ලද, ශ්‍රේණිගත කරන ලද ලැයිස්තු ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර පත් කිරීම් මෙන්ම පුරප්පාඩු පිරවීම් ද ප්‍රකාශිත අනුපිළිවෙලට අනුව සිදු කළ යුතු වේ.
V. දැනට 104(ආ) වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යය සහ කර්තව්‍යයන් අතරට, කවර හෝ ලියාපදිංචි දේශපාලන පක්ෂයක් වේද, එකී පක්ෂ මගින් ඉදිරිපත් කරන නාමයෝජනා ලැයිස්තු තුළ අවම කෝටාවක් සහතික කිරීමේ කාර්යය ද ඇතුළත් විය යුතු ය.

පක්ෂ ව්‍යුහය සහ කාන්තා නියෝජනය තහවුරු කිරීමේ වගකීම

දේශපාලන පක්ෂ සඳහා ප්‍රචාරණ කටයුතු සහ අනෙකුත් අවැසි සහය ලබා දීමේ දී කාන්තාවන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කල ද, ඔවුන් පක්ෂවල තීරණ ගැනීමේ ව්‍යුහ තුළ දී නොසලකා හරිනු ලබන අතර මැතිවරණවලදී සාර්ථක වීමේ හැකියාවක් සහිත අපේක්ෂකයන් ලෙස සලකා බැලීමේදී වුව නිසි අවධානයට ලක් නොවේ. ඒ අනුව පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරමින් ඉදිරියට යාම සඳහා, නායකත්ව සහ තීරණ ගැනීමේ තනතුරුවලට පක්ෂයේ සාමාජිකයින් පත් කිරීමේ දී සහ උසස් කිරීමේ දී සාධාරණ ක්‍රමවේදයක් පවත්වාගන්නා ලෙසට දේශපාලන පක්ෂවලට නියම කරනු ලැබිය යුතු ය. එබැවින්:

VI. දැනට පවත්නා අසමතුලිතතාව නිවැරදි කිරීමට, දේශපාලන පක්ෂ තුළ සියලු නායකත්ව සහ තීරණ ගැනීමේ මණ්ඩලවලට අවම වශයෙන් 30%ක් කාන්තාවන් පත් කළ යුතු බව නීත්‍යානුකූලව අනිවාර්ය කරනු ලැබිය යුතු අතර මෙය පක්ෂ ලියාපදිංචි කිරීම සඳහා අනිවාර්ය අවශ්‍යතාවක් විය යුතු ය.
VII. දේශපාලන පක්ෂ, මැතිවරණවලදී තරග කිරීමට අපේක්ෂකයන් තෝරා ගැනීම සඳහා

පැහැදිලි, විනිවිදභාවයෙන් යුත් මෙන්ම ස්ත්‍රීපුරුෂ සංවේදී රීති සකස් කළ යුතු ය.
VIII. කාන්තාවන් දේශපාලනයට ඇතුළත් කිරීම සඳහා පක්ෂ විසින් ඔවුන්ව උනන්දු කරවීම, පුහුණු කිරීම සහ ඔවුන්ට සහාය දැක්වීම සිදු කල යුතු අතර ක්‍රියාකාරී දේශපාලන සහභාගිත්වය පිළිබඳ වාර්තා ද සහිතව අපේක්ෂකයකු වීමේ හැකියාවක් පවතින කාන්තාවන්ගේ ලැයිස්තුවක් පවත්වාගෙන යා යුතු ය.

**ඈ. ආචාරධර්ම සංග්‍රහය**
I. තෝරා පත් කරගත් නියෝජිතයන් සඳහා නෛතික වශයෙන් බැඳෙන ආචාරධර්ම සංග්‍රහයක් ස්ථාපිත කල යුතුය.
II. එම ආචාරධර්ම සංග්‍රහය උල්ලංඝනය කරනු ලබන තැනැත්තෙක් වේද, එකී තැනැත්තන් අධිකරණය විසින් චෝදනා ලැබිය යුතු අතර ආපසු කැඳවීමට යටත් විය යුතු ය.
III. ආචාරධර්ම සංග්‍රහය උල්ලංඝනය කරන රජයේ සියලු මට්ටම්වල තෝරා පත් කරගත් නියෝජිතයන් සඳහා නැවත කැඳවීමේ ක්‍රමවේදයක් පිහිටුවනු ලැබිය යුතු ය.[4]
IV. පක්ෂවල නියෝජිතයන් ලෙස කටයුතු කරන පුද්ගලයන්ගේ දූෂිත සහ නීතිවිරෝධී කටයුතු සඳහා නිවාරකයක් වශයෙන් දේශපාලන පක්ෂ මත දඩුවම් පමුණුවනු ලැබිය යුතු ය. මැතිවරණවලට අදාළ පනත් මෙකී දඬුවම් නීතිගත කිරීම සඳහා සංශෝධනය කරනු ලැබිය යුතු ය.
V. දිවුරුම් දීම යටතේ පහත දැක්වෙන කරුණු ප්‍රකාශ කිරීම සඳහා වන දිවුරුම් ප්‍රකාශයක් සෑම අපේක්ෂකයකු විසින්ම නාමයෝජනා පත්‍රයට අමුණන බව සහතික කිරීම සඳහා මැතිවරණ නීති සංශෝධනය කරනු ලැබිය යුතු ය.[5]

a. අපේක්ෂකයාගේ අධ්‍යාපනික සුදුසුකම් සහ එම සුදුසුකම් ලබාගත් දින.
b. අපේක්ෂකයා යම් අධිකරණයක දී යම් වරදකට වරදකරු කරනු ලැබ තිබේද යන්න සහ එම වරදේ ස්වභාවය, අධිකරණයේ තීන්දුව.

VI. අපරාධ වාර්තා සහිත / දඬුවම් ලැබ වරදකරුවන් බවට පත්වූ පුද්ගලයන් මැතිවරණ සඳහා තරග කිරීම තහනම් කළ යුතු ය.
VII. දේශපාලන පක්ෂ, මහජන නියෝජිතයන්ගේ කාර්යාලයන්හි සේවයේ නියුතු සේවක පිරිස ඇතුළුව සියලු සේවක පිරිස් සඳහා ස්ත්‍රීපුරුෂ සමජභාවයහා සංවේදී ආචාර ධර්ම සංග්‍රහයක් සකස් කළ යුතු අතර එය උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් වහාම කටයුතු කරනු ලැබිය යුතුය.

මැතිවරණ ක්‍රම සහ භාවිතාවන් ක්‍රියාවට නැඟීමෙහිලා යෝජිත ප්‍රතිසංස්කරණ නොතකා සලකා බැලිය යුතුවන නිර්දේශ

ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම පූර්ණ ලෙස සාක්ෂාත් කරගැනීම සඳහා සහ ඡන්ද බලය ක්‍රියාත්මක කිරීම සඳහා මූලික වශයෙන් පහත දැක්වෙන ක්ෂේත්‍ර හඳුනාගෙන ඇත. මෙම නිර්දේශ සියලු දේශපාලන පක්ෂවලට ප්‍රයෝජනවත් බව සහ දේශපාලන න්‍යාය පත්‍ර නොසලකා යොදාගත හැකි බව අප විශ්වාස කරන්නෙමු.

**ඈ. ලියාපදිංචි දේශපාලන පක්ෂ ක්‍රමානුකූලව නියාමනයට ලක් කිරීම**
• දේශපාලන පක්ෂවල කටයුතු නිර්ණය කිරීම සඳහා වන එකම මාර්ගෝපදේශය වසර 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත පමණි. මෙය වත්මන් අවශ්‍යතා සහ සන්දර්භීය වෙනස්කම්වලට අනුව සියලු දේශපාලන පක්ෂ විමසා ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය.
• දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම සඳහා බලාත්මක කළ හැකි මාර්ගෝපදේශ නියම කිරීම මගින් පක්ෂ ක්‍රියාකාරකම් වඩා හොඳින් අධීක්ෂණය කිරීමට සහ නියාමනය කිරීමට හැකි වේ.
• නායකත්ව සහ තීරණ ගැනීමේ තනතුරු සඳහා කාන්තාවන් පත් කරනු ලැබිය යුතු ය,

[4] The Recall of MPs Act 2015 of England and Wales could be taken as a guideline in this regard.
[5] PRC report

අනිවාර්ය කෝටාවක් ක්‍රියාත්මක  කරනු ලැබිය යුතු ය. (ඉහත “ආ VI” බලන්න).

**ඉ. පූර්ව ඡන්ද භාවිතය**

මැතිවරණ පැවැත්වෙන දිනයේදී සම්ප්‍රදායික වශයෙන් අඩු අවස්ථා ලබන්නන් ලෙස සැලැකෙන ඡන්දදායකයන්ගේ ඡන්ද බලය පූර්ණ වශයෙන් සාක්ෂාත් කර ගැනීම සඳහා පූර්ව ඡන්ද ප්‍රකාශ කිරීමේ නිසි ක්‍රමවේදයක්  හඳුන්වා දෙනු ලැබිය යුතු ය.

• නිසි ආරක්ෂණ ක්‍රම  සහිතව විද්‍යුත් ඡන්ද ප්‍රකාශ  කිරීමේ ක්‍රමයක් (electronic voting)  හඳුන්වාදීම සඳහා වන යාන්ත්‍රණයක්  සලකා බලනු ලැබිය යුතුය.

• කර්මාන්තශාලා සේවකයන්ට, නිදහස් වෙළඳ කලාප සේවකයන්ට, පූර්ව නඩු විභාග රැඳවුම් සිරකරුවන්ට, ඡන්දය ප්‍රකාශ කිරීමේ අවකාශ සහිත  බන්ධනාගාර සිරකරුවන්ට, ආබාධ සහිත පුද්ගලයන්ට, රෝහල්, නිරෝධායන මධ්‍යස්ථාන  සහ දීර්ඝ කාලීනව  සුරැකුම් මධ්‍යස්ථානවල  රැඳී සිටින ඡන්දදායකයන්ට සහ ජ්‍යෙෂ්ඨ  පුරවැසියන්ට යන පිරිස් වෙත ඡන්දය ප්‍රකාශ  කිරීම සඳහා පහසුකම් සැලැස්වීමට විශේෂයෙන් සකස්කළ තාවකාලික ස්ථාන හෝ පූර්ව ඡන්ද භාවිතය සඳහා සුදුසු  වෙනත් වැඩපිළිවෙලක්  සකස් කරනු ලැබිය යුතු ය.

• රජයේ ලියාපදිංචි සංක්‍රමණික සේවකයන්ට, මැතිවරණ දිනය වන විට විදේශ රටක පදිංචිව සිටින හෝ තාවකාලිකව එතෙර සිටින ඡන්දදායකයන් හට  ඡන්දය ප්‍රකාශ  කිරීම සඳහා අවසර ලබා දිය යුතු අතර ඊට උචිත යාන්ත්‍රණයක් ද  හඳුන්වාදෙනු ලැබිය යුතු ය.[6]

**ඊ. මැතිවරණ ප්‍රචාරණ මූල්‍යකරණය**

• අපේක්ෂකයන් විසින් සහ ඔවුන් වෙනුවෙන් සිදු කරනු ලබන මැතිවරණ ආශ්‍රිත  වියදම් සම්බන්ධයෙන් නීතිමය වශයෙන් නියම කරන ලද යම් සීමාවක් පැවතිය යුතු අතර මැතිවරණ ප්‍රචාරණය සඳහා අරමුදල් සැපයුම්කරුවන් සහ ආධාරකරුවන් නම් කරන ලෙසට දේශපාලන පක්ෂවලට අපේක්ෂකයන් හට  නියම කළ යුතු ය.

• විදේශ මූලාශ්‍ර ද ඇතුළුව අරමුදල් සැපයීමේ මූලාශ්‍ර  හඳුනාගැනීම සඳහා මහ බැංකුව හරහා මූල්‍ය  රෙගුලාසි ද සමග මෙය අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙත බලය ලබා දිය යුතු ය.

• තරග කිරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයන්, තමන් තරඟ කරන සෑම මැතිවරණයකට ම තම වත්කම් හා බැරකම් ප්‍රකාශ ජනගත කලයුතු අතර, අනතුරුව එළඹෙන සෑම වර්ෂයකම තමන් තේරීපත්වුවහොත් අදාළ  ධූර කාලය අවසන් වන තෙක් එම ප්‍රකාශ  ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.[7]

• මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රජයේ දේපළ අනිසි ලෙස භාවිත කිරීම තහනම් කිරීම සඳහා වන නව නියාමන මාර්ගෝපදේශ සකස් කරනු ලැබිය යුතු ය. දේශපාලන පක්ෂ, අපේක්ෂකයන් සහ ඔවුන්ගේ ආධාරකරුවන් විසින් රජයේ සම්පත් සහ මාධ්‍ය  අනිසි ලෙස භාවිතයට එරෙහිව වහාම නීතිමය ක්‍රියාමාර්ග  ගැනීමට හැකිවන සේ නිසි බලධරයා ලෙසින් මැතිවරණ කොමිෂන් සභාව කටයුතු කළ යුතු ය.

• පළාත් පාලන ආයතනයන්හි කොට්ඨාශ සහ ලැයිස්තුගත සභිකයන් ලෙස කටයුතු කරන යන දෙපිරිස සඳහාම තම පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ සිදුකරන  කාර්යයන් සඳහා එකසමාන අනුපාතයකින් යුක්තව මූල්‍ය සම්පත් බෙදාහැරීමට අදාළ පළාත් පාලන ආයතන කටයුතු කල යුතුය.

• ඉහත කී කරුණට අදාළව, සෑම අපේක්ෂකයෙක්ම තමන් මැතිවරණය සඳහා කල වියදම් පිළිබඳ ප්‍රකාශ පත්‍රයක් ඉදිරිපත් කල යුතු අතර මැතිවරණ වියදම් පිළිබඳ රීති උල්ලංඝනය කරන අවස්ථාවකදී  ඊට අදාළව හිමිවන දඬුවම ද (තමන් ජයගත් ආසනය අහිමිවීම) එකී ප්‍රකාශයෙහි අන්තර්ගත කල යුතුය.

**උ. මැතිවරණ ප්‍රචණ්ඩත්වය[8]**

---

[6] PRC report and WMC recommendations to the Committee for drafting a new Constitution.

[7] Ibid

[8] Final Report on Election Related Violence And Malpractices Parliamentary General Election – 2010, CMEV https://cmev.org/wp-content/uploads/2010/12/final-report-on-election-violence-and-malpracticesenglish-ge-2010.pdf

- කාන්තා දේශපාලඥයන් හට ආරක්ෂාව සැලසීම සඳහා නීති මගින් විධිවිධාන සැලැස්විය යුතු අතර මාධ්‍ය තුළ වුවද වෙනත් දේශපාලඥයන් විසින් වුවද, වෛරී ප්‍රකාශ සිදු කිරීම සහ චරිත ඝාතනය ඇතුළු කාන්තා අපේක්ෂකයන්ට එරෙහිව රහසිගතව හෝ ප්‍රසිද්ධියේ සිදු කෙරෙන සියලු ආකාරවල මැතිවරණ ප්‍රචණ්ඩත්වය මුලිනුපුටා දැමිය යුතු ය.

- මැතිවරණ ප්‍රචණ්ඩත්වයට අදාළව පොදුවේ එකඟ වන මැතිවරණ ආචාර ධර්ම සංග්‍රහයක් දේශපාලන පක්ෂ සහ ඒවායෙහි අපේක්ෂකයන් සඳහා හඳුන්වාදෙනු ලැබිය යුතු ය.

- අදහස් ප්‍රකාශ කිරීමේ සහ තොරතුරු ලබා ගැනීමේ නිදහස ආරක්ෂා කරමින්, රජයේ සහ පෞද්ගලික මාධ්‍ය තුළ වෛරී ප්‍රකාශ සිදු කිරීම, වැරදි තොරතුරු ලබා දීම සහ නිවැරදි තොරතුරු ලබා නොදීම අඩු කිරීම සඳහා, මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සහ පුළුල් සිවිල් සමාජය විමසා සුදුසු නීති සකස් කරනු ලැබිය යුතු ය.